සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**

මගේ අංකය / **எனது இல** / My No DSD/HO/IT/11/CRM

ඔබේ අංකය / **உமது இல** / Your No ........................................

දිනය / **திகதி** / Date 2024.07. 02

**සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,**
**දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරු,/ප්‍රාදේශිය ලේකම්වරු,**
**දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,/ සහකාර අධ්‍යක්ෂවරුන්,**
**සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි බැංකු කළමණාකරු,/ සමෘද්ධි බැංකු සමිති කළමණාකරුවන්,**

**2022 වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් මාස සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය මත සිදු කල සමෘද්ධි, වැඩිහිටි, ආබාධිත, වකුගඩු ගෙවීම් සම්බන්ධ විස්තරාත්මක වාර්තා ලබා ගැනීම.**

2022 වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් මාස සඳහා සමෘද්ධි, වකුගඩු, ආබාධිත, වැඩිහිටි, සියවස් පූර්ණ හා කිරිදෙන මව්වරුන් සඳහා සමෘද්ධි බැංකු මඟින් ගෙවීම් සිදු කරන ලදි. මෙම ගෙවීම සඳහා මුදල් සම්පාදනය කර ගනු ලැබුයේ ආසියානු සංවර්ධන බැංකුව ලබා දුන් ණය මඟිනි. ආසියානු සංවර්ධන බැංකුව (ADB) ලබා දුන් මෙම ණය මුදල නිසි පරිදි ප්‍රතිලාභීන් අතට පත්ව ඇත්දැයි විගණනය කිරීමට මෙම ගෙවීම් සම්බන්ධ විස්තරාත්මක නාම ලේඛනයක් අවශ්‍යව ඇත. අදාළ ගෙවීම් පහත සඳහන් කාණ්ඩ යටතේ සිදු කරන ලදි.

| | | |
|---|---|---|
| 1. | සමෘද්ධි නිත්‍ය ගෙවීම් | Samurdhi Existing Payments |
| 2. | සමෘද්ධි අමතර දීමනාව | Samurdhi Top up Payments |
| 3. | සමෘද්ධි පොරොත්තු ගෙවීම් | Samurdhi Waiting Payment |
| 4. | වැඩිහිටි නිත්‍ය ගෙවීම් | Elder Existing Payments |
| 5. | වැඩිහිටි අමතර ගෙවීම් | Elder Top up Payments |
| 6. | වැඩිහිටි පොරොත්තු ගෙවීම් | Elder Waiting Payments |
| 7. | ආබාධිත නිත්‍ය ගෙවීම් | Disable Existing Payments |
| 8. | ආබාධිත අමතර ගෙවීම් | Disable Top up Payments |
| 9. | ආබාධිත පොරොත්තු ගෙවීම් | Disable Waiting Payments |
| 10. | වකුගඩු නිත්‍ය ගෙවීම් | CKD Existing Payments |
| 11. | වකුගඩු අමතර ගෙවීම් | CKD Top up Payments |
| 12. | වකුගඩු පොරොත්තු ගෙවීම් | CKD Waiting Payments |
| 13. | සියවස් පූර්ණ නිත්‍ය ගෙවීම් | Over Hundred Existing Payments |
| 14. | සියවස් පූර්ණ අමතර දීමනාව | Over Hundred Top up Payments |

**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

15. ගර්භනී මව්වරුන් සඳහා ගෙවීම් කිරීම Payments for Pregnant Women

ඉහත සඳහන් කාණ්ඩ වලට අදාලව උක්ත මාස 3ට හා 2022 අගෝස්තු හා දෙසැම්බර් සමෘද්ධි නිත්‍ය දීමනාවට අදාල නාම ලේඛන මෙහි අමුණා ඇති ආකෘතියට (ඇමුණුම 01) අනුව සකස් කළ යුතුය.

උක්ත සඳහන් කරන ලද දත්ත ඇතුලත් කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුව දත්ත ඇතුලත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

i. ඒ ඒ බැංකු ඒ ඒ නිර්ණායක මත ගෙවීම් සම්බන්ධ අභ්‍යන්තර විගණන අංශයද මැදිහත් වී ලබා ගත් වියදම් වාර්තා මේ වන විට ADB වෙත ලබාදී ඇත. ඒ අනුව,
බැංකු විසින් සකස් කරනු ලබන වියදම් වාර්තාව බැංකු තොරතුරු ලබාගන්නා අවස්ථාවේදී ලබා දුන් නම් සංඛ්‍යාව හා මුදලට සමාන විය යුතුය.

ii. ඒ ඒ බැංකුව ගෙවා ඇති පවුල් සංඛ්‍යාව හා මුදල ඇතුළත් වාර්තාව ප්‍රධාන කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් දිස්ත්‍රික් කාර්යාලයේ බැංකු විෂය භාර නිලධාරි වෙත ලබා දෙන අතර බැංකු විෂයභාර නිලධාරි විසින් ඒ ඒ බැංකු වලට ලබා දිය යුතුය.

iii. සෑම බැංකුවක්ම සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් මාස සඳහා ඉහත සඳහන් කර ඇති වර්ගීකරණය අනුව නාම ලේඛන සකස් කල යුතුය.

iv. මෙම නාම ලේඛන Excel ගොනුවක් ලෙස ලබා දී ඇති ආකෘතියට අනුව ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කළ යුතුය.

v. දිස්ත්‍රික් කාර්යාලයේ බැංකු විෂය භාර නිලධාරි විසින් බැංකු මට්ටමින් එම ලේඛන email මඟින් ලබා ගෙන ප්‍රධාන කාර්යාලයේ විෂය භාර නිලධාරියාට ලබා දීමට කටයුතු කල යුතුය.

vi. මෙම වාර්තා 2024.07.15 දිනට පෙර දිස්ත්‍රික් බැංකු විෂය භාර නිලධාරි විසින් ප්‍රධාන කාර්යාලයට email මඟින් Excel ගොනු ලෙස පහත සඳහන් විද්‍යුත් ලිපිනයට යොමු කල යුතුය. (මුද්‍රිත පිටපත් අවශ්‍ය නොවේ.)

මෙය ඉතා හදිසි සහ අත්‍යාවශ්‍ය කාර්යයක් බැවින් මේ සඳහා අවශ්‍ය අවස්ථා වල අමතර නිලධාරින් ද මෙම කාර්යයට යොදවා ගන්නා ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි.

**සී.ඩී. කළුආරච්චි**

අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්**

01. ලේකම් (කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය) - කා.දැ.පි
02. අධ්‍යක්ෂ ජනරාල් (ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව) - කා. දැ.පි
03. සියළු අංශ ප්‍රධානින් - අවශ්‍ය නිලධාරින් නිදහස් කිරීම සඳහා
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කා. දැ.පි

**උදාහරණ:**

Topic: (Samurdhi Existing Payment)

District : Colombo

Divisional secretariat: Maharagama

Samurdhi Bank Name: Maharagama Town

Year : 2022 Month: September

| Serial No | Beneficiary Name | Bank Account Number | Amount Rs. |
|---|---|---|---|
| 1 | ABC Karunadasa | 123456 | 6,000.00 |
| 2 | B Leelawathi | 234567 | 8,000.00 |
| 3 | C Kokila | 345678 | 9,000.00 |
| 4 | D Malmawathi | 456789 | 3,500.00 |
| 5 | E Kumudumathi | 567891 | 2,000.00 |
| 6 | F Sugala | 678910 | 7,000.00 |
| **Total** | | | **35,500.00** |

Topic: …………………………………………………………………………………………..

District : ……………………………………………..

Divisional secretariat: ………………………..

Samurdhi Bank Name: ……………………….

Year : …………………………………………      Month: ……………………………………………….

| Serial No | Beneficiary Name | Bank Account Number | Amount Rs. |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| **Total** | | | |